සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

Provincial Department of Education වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education

## තෙවන වාර පරීක්ෂණය - 7 ශ්‍රේණිය - 2019
## Third Term Test - Grade 7 - 2019

**නම : ...............................................** **පෙරදිග සංගීතය** **කාලය : පැය 02 යි.**

සැළකිය යුතුයි :

- **ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.**
- **ප්‍රශ්න අංක 1 - 10 දක්වා ප්‍රශ්න සඳහා වඩාත් සුදුසු පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

## I කොටස

(1) පාසල් අධ්‍යාපනයේ දී, අප හදාරණ සංගීත පද්ධතිය හඳුන්වන්නේ,
- (i) දකුණු ඉන්දියානු කර්ණාටක සංගීත පද්ධතිය ලෙසය.
- (ii) උතුරු ඉන්දියානු හින්දුස්ථානි සංගීත පද්ධතිය ලෙසය.
- (iii) අපරදිග බටහිර සංගීත පද්ධතිය ලෙසය.
- (iv) දේශීය ජන සංගීත පද්ධතිය ලෙසය.

(2) සප්තකයක ඇති, කෝමළ ස්වර සංඛ්‍යාව වන්නේ,
(i) 2කි (ii) 5කි (iii) 4කි (iv) 7කි

(3) ස්වරස්ථාපන ගීත නිතර ගායනය කිරීම තුළින්,
(i) ස්වර ඥාණය වැඩිවේ. (ii) රාග ඥාණය වැඩිවේ.
(iii) තාල ඥාණය වැඩිවේ. (iv) මතක ශක්තිය වැඩිවේ.

(4) ''කටු අකුලේ මල් ඇහැරේ...'' යන ගීතය අයත් නාට්‍ය වන්නේ,
(i) මල් ගුඩි දවස (ii) අඹ යාළුවෝ (iii) මුහුදු පුත්තු (iv) රේබාව

(5) සප්තකයක ඇති චල ස්වර හඳුන්වන ස්වර නාමයන් පිළිවෙළින් වනුයේ,
- (i) කෝමළ රිෂභය, කෝමළ ගාන්ධාරය, තීව්‍ර මධ්‍යමය, කෝමළ ධෛවතය, කෝමළ නිෂාදය
- (ii) ශුද්ධ රිෂභය, කෝමළ ගාන්ධාරය, තීව්‍ර මධ්‍යමය, කෝමළ ධෛවතය, ශුද්ධ නිෂාදය
- (iii) කෝමළ රිෂභය, කෝමළ ධෛවතය, තීව්‍ර මධ්‍යමය, කෝමළ ගාන්ධාරය, කෝමළ නිෂාදය
- (iv) කෝමළ ගාන්ධාරය, කෝමළ නිෂාදය, ශුද්ධ මධ්‍යමය, කෝමළ රිෂභය, කෝමළ ධෛවතය

(6) ත්‍රිවිධ සප්තකයෙහි ඇති, සම්පූර්ණ ප්‍රකෘති හා විකෘති ස්වර සංඛ්‍යාව වන්නේ,
(i) 12කි. (ii) 05කි. (iii) 36කි. (iv) 24කි.

(7) ''ධා ගෙ | න ති | න ක | ධි න'' යන ඨේකාව හඳුන්වන්නේ,

| ධා ගෙ | න ති | න ක | ධි න |
|---|---|---|---|
| × | 2 | 0 | 3 |

(i) දාදරා තාලය නමිනි. (ii) ත්‍රිතාලය නමිනි.
(iii) කෙහෙර්වා තාලය නමිනි. (iv) ලාවනී තාලය නමිනි.

(8) සුළඟේ ආධාරයෙන් හඬ නිපදවිය හැකි සංගීත භාණ්ඩ යුගලයකි.

(i) වයලීනය, මවුත් ඕගන් (ii) හාර්මෝනියම්, තබ්ලාව

(iii) බටනලාව, ග්ලොකන් ස්පීල් (iv) මවුත් ඕගන්, රෙකෝඩර් ෆ්ලූට්

(9) + රළ ලා s | උ පු ලා s | + ලෙළු ම තු | ලා s යා s ගීතයෙහි ගායනය ආරම්භ වන්නේ,

(i) සමග්‍රහයෙනි (ii) අවග්‍රහයෙනි (iii) විෂමග්‍රයෙනි (iv) සමස්ථානයෙනි

(10) "^" "/ " යන සංකේත භාවිතා කරන තාල වාද්‍ය භාණ්ඩය වනුයේ,

(i) තාලම්පට (ii) ගැටබෙරය (iii) රබාන (iv) තම්මැට්ටම

- **ප්‍රශ්න අංක 11 - 15 දක්වා ඇති ප්‍රශ්නවලට, පිළිතුරු වරහන් තුළ දී ඇති පිළිතුරුවලින් තෝරා හිස්තැනට සුදුසු වචනය ලියන්න.**

(දම්වැසි වස්සන ලෝකේ, උපදේශාත්මක, විෂමග්‍රහ, දෙවොල් බෙරය, සිතාරය)

(11) කෝළම් නාට්‍ය සඳහා ප්‍රධාන තාල වාද්‍ය භාණ්ඩය ලෙස .......................................................... යොදා ගැනේ.

(12) ''.........................................................'' යන ගීතය නීතිඥ චාල්ස් ඩයස් සූරීන්ගේ විදුර නූර්තියේ එන ගීතයකි.

(13) ''හෙ ළ /ජා s ති ක / අ හි මා s / නේ s s s '' ... යන ගීතය ....................................... යෙන් ආරම්භ කෙරේ.

(14) හින්දුස්ථානි සංගීතයේ ප්‍රධාන තාල වාද්‍ය භාණ්ඩය තබ්ලාව වන අතර ප්‍රධාන ස්වර වාද්‍ය භාණ්ඩය ............................. ......................................... වේ.

(15) ''.....................................................'' ගීතයක් ලෙස ''දූ පුතුනේ රට අපේය'' ගීතය හැඳින්විය හැකිය.

- **ප්‍රශ්න අංක 16 - 20 දක්වා ඇති ප්‍රකාශන නිවැරදි නම් (✓) ලකුණ ද වැරදි නම් (✖) ලකුණ ද වරහන තුළ යොදන්න.**

(16) ''උඩු නියරෙන් වැටී ගෙනේ'' දරු නැළවිලි ගීතයකි. ( ................. )

(17) රබන් කවි ගායනයක් සමඟ නර්තනයේ යෙදෙයි. ( ................. )

(18) වයලින් පවුලට අයත් භාණ්ඩවල තත් සංඛ්‍යාව වෙනස් ය. ( ................. )

(19) දෑල් ගී සාමූහිකව ගායනා කරනු ලබන ගී විශේෂයකි. ( ................. )

(20) මවුත් ඕගනය ස්වර පුවරු භාණ්ඩයකි. ( ................. )

## II කොටස

- **පළමු ප්‍රශ්නය ඇතුළු ප්‍රශ්න 3 කට පිළිතුරු සපයන්න.**

01. (i) කෝමළ ග, නි යෙදෙන, ඔබ කැමැති ස්වරස්ථාපන ගීතයක් ගීත ස්වර ප්‍රස්තාර කරන්න.
(ලකුණු 6)

(ii) එම ගීතයට අදාළ හින්දුස්ථානි තාලය නම්කර නියමිත තාල සංඥා සහිතව ප්‍රස්තාර කරන්න.
(ලකුණු 4)

02. පහත සඳහන් පද පේළි පිළිතුරු පත්‍රයෙහි පිටපත් කරගෙන ඒවාට අදාළ වන තිත් සංඥා යොදා තිත්රූප නම් කරන්න.

(i) (a) ගයමු | මියුරු |ගී s ත| අපිත්|

(b) බුදුහිමි|පා s මු ල|දූල්වෙන|පහනකි|

(c) ගත |සිත| පුබු |දන
පොත|පත|රක|ගමු (ලකුණු 6)

(ii) ඔබ කැමති තිත් රූපයක් නම් කර, එයට අදාළ බෙර පදය නියමිත සංකේත යොදා ප්‍රස්තාර කරන්න.
(ලකුණු 4)

03. ඔබ ස්වර වාදනය සඳහා තෝරාගත් සංගීත භාණ්ඩය පදනම් කරගෙන පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(i) භාණ්ඩයේ නම සඳහන් කරන්න. (ලකුණු 1)
(ii) භාණ්ඩය අයත් භාණ්ඩ වර්ගය (ලකුණු 1)
(iii) භාණ්ඩයේ ප්‍රධාන තත් සංඛ්‍යාව කීය ද? (ලකුණු 1)
(iv) එම තත් නම් කරන්නේ කෙසේ ද? (ලකුණු 2)
(v) එම තත් සුසර කරන ස්වර නම් කරන්න. (ලකුණු 2)
(vi) ශුද්ධ ස්වර 7 පිහිටන ආකාරය දළ රූප සටහනක් ඇඳ ලකුණු කරන්න. (ලකුණු 3)

හෝ

තත් වාද්‍ය නොවන භාණ්ඩයක් නම්,

(i) භාණ්ඩයේ නම සඳහන් කරන්න. (ලකුණු 1)
(ii) භාණ්ඩය අයත් භාණ්ඩ වර්ගය (ලකුණු 1)
(iii) ශුද්ධ ස්වර 7 පිහිටන ආකාරය දළ රූප සටහනක් මගින් පැහැදිලි කරන්න. (ලකුණු 4)
(iv) ''රි ග ම් ධ නි '' යන ස්වර නිපදවන ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 4)

04. (i) ඔබ උගත් දූල් ගීතයක් ලියන්න. (ලකුණු 4)
(ii) එහි භාෂාව, නාදමාලාව පිළිබඳ කරුණු පැහැදිලි කරන්න. (ලකුණු 6)

05. පහත සඳහන් මාතෘකා දෙකක් පිළිබඳව, උදාහරණ දක්වමින් පැහැදිලි කරන්න.

(a) නූර්ති ගී
(b) දරු නැළැවිලි ගී
(c) දේශාභිමානි ගී
(d) රබන් ගී

සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

Provincial Department of Education - NWP

# තෙවන වාර පරීක්ෂණය - 7 ශ්‍රේණිය - 2019

# Third Term Test - Grade 7 - 2019

## පෙරදිග සංගීතය - ප්‍රායෝගික පරීක්ෂණය

- **ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුයි.**

01. ඔබ කැමති ස්වරස්ථාපන ගීතයක් ගායනය (ලකුණු 10)

02. දරු නැළවිලි, රබන්, දූල් මින් කැමැති ගීතයක් ගායනය (ලකුණු 10)

03. ඔබ කැමති හින්දුස්ථානි තාලයක් හෝ දේශීය තිත් රූපයක් අතින් තාල තැබීම (ලකුණු 10)

04. ඔබ තෝරාගත් භාණ්ඩයේ ස්වරස්ථාපන ගීතයක් වාදනය (ලකුණු 10)

05. ඔබ කැමැති (ශ්‍රී වික්‍රම, රාමායනය, විදුර) යන නූර්ති වලින් එක ගීතයක් ගායනය (ලකුණු 10)

(මුළු ලකුණු 50)

සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

**Answer**

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

**Provincial Department of Education - NWP**

## තෙවන වාර පරීක්ෂණය - 7 ශ්‍රේණිය - 2019

## Third Term Test - Grade 7 - 2019

### පෙරදිග සංගීතය - පිළිතුරු පත්‍රය

### I කොටස

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| (1) | (ii) | (6) | (iii) | (11) | දෙවොල් බෙරය | (16) | ✓ |
| (2) | (iii) | (7) | (iv) | (12) | දම්වැසි වස්සන ලෝකේ | (17) | ✓ |
| (3) | (i) | (8) | (iv) | (13) | විෂමග්‍රහ | (18) | ✖ |
| (4) | (ii) | (9) | (ii) | (14) | සිතාරය | (19) | ✓ |
| (5) | (i) | (10) | (i) | (15) | උපදේශාත්මක | (20) | ✖ |

(ලකුණු 1 × 20 = ලකුණු 20කි)

### II කොටස

01. (i) ස්වරස්ථාපන ගීතයේ ස්වර ප්‍රස්තාරයට (ගු නි තිබිය යුතුය) (ලකුණු 4)
(ii) ගීතයේ පද ප්‍රස්තාරයට (ලකුණු 2)
(iii) තාලය නම් කිරීමට (ලකුණු 1)
තාල සංඥා වලට (ලකුණු 1)
යේකාවට (ලකුණු 2) මුළු ලකුණු 10

02. (i) තිත් සංඥා යොදා තිත් රූප නම් කිරීමට (abc) (ලකුණු 3 × 2) (ලකුණු 6)
(ii) තිත් රූපය නම් කිරීමට (ලකුණු 1)
(iii) තිත් සංඥාවලට (ලකුණු 1)
බෙර පදය (උඩරට/පහතරට/ සබරගමු) (ලකුණු 2) මුළු ලකුණු 10

03. (i) භාණ්ඩයේ නම (ලකුණු 1)
(ii) භාණ්ඩ වර්ගය (තත්, සුෂිර) (ලකුණු 1)
(iii) තත් සංඛ්‍යාවට (ලකුණු 1)
(iv) තත් නම් කිරීමට (ලකුණු 2)
(v) සුසර කරන ස්වර නම් කිරීමට (ලකුණු 2)
(vi) ශුද්ධ ස්වර 7 සහ දළ රූපසටහනට (ලකුණු 3) මුළු ලකුණු 10

හෝ

(i) භාණ්ඩයේ නම (ලකුණු 1)
(ii) භාණ්ඩ වර්ගය (ලකුණු 1)
(iii) ශුද්ධ ස්වර 7 සහ දළ රූප සටහනට (ලකුණු 4)
(iv) ''රි ගු ම් ධ නි'' ස්වර පිළිබඳ පැහැදිලි කිරීමට (ලකුණු 4) (මුළු ලකුණු 10)

04. (i) දූල් ගීතයේ පද මාලාවට (ලකුණු 4)
(ii) භාෂාව, නාදමාලාව (3 × 2) (ලකුණු 6) (මුළු ලකුණු 10)

05. මාතෘකාව පැහැදිලි කිරීමට (ලකුණු 3)
උදාහරණයට (ලකුණු 2)
a, b, c, d වලින් මාතෘකා දෙකකට (ල. 5 × 2) (මුළු ලකුණු 10)